## 2018 මාර්තු මාසය සඳහා අයැදීමට සහ මැදිහත් වීමට අත්වැලක්

**"ක්‍රිස්තුන් වහන්සේ මිනිසත් බව ගෙන සිටියදී තමන් මරණයෙන් ගලවන්නට පිළිවන් වූ තැනැන් වහන්සේට බලවත් හැඬීමෙනුත් කඳුළු සැලීමෙනුත්, යාච්ඤා ද කන්නලවු ද ඔප්පු කළ සේක. "**

(හෙබ්‍රෙව් 5:7)

අයැදීමේ සේවකයන් වශයෙන් මෙම චතාරික සමය තුළ ශුද්ධවූ සභාවේ ජනවන්දනා පිළිවෙත්වලට සහභාගි වන අතර පුබුදු දිවැසි එකතුව අපට උපදෙස් දී ඇති පරිදි භාග්‍යවන්ත අම්මාගේ මැදිහත් වීම තුළ ජපමාලය උච්චාරණය කරමින් ,

* දේව සේවක තෝමස් කුරේ කාදිනල් හිමිපාණන් ශුද්ධවරයට ඔසවාලීම සඳහාත්,
* අති උතුම් මැල්කම් රංජිත් හිමිපාණන් ඇතුළු සියළුම රදගුරු මණ්ඩලය ඇතුළු පූජකවරුන් සඳහාත්,
* ස්වාමි තාත්තා ඇතුළු දිවැසි එකතුව වෙනුවෙන් ද,
* සියළුම පුබුදු නායකත්වය වෙනුවෙන් ද,
* මුළු මහත් පුබුදු ජනතාවගේ පුබුදු ගමන වෙනුවෙන් සහ මනස්ථාපනයේ වසර හතර වෙනුවෙන් ද

අඛණ්ඩව යාච්ඤාවේ යෙදෙන අතර, චතාරික භාවනා ද සුපුරුදු ලෙස අපගේ මැදිහත් අයැදීම් ජේසු ක්‍රිස්තුන් වහන්සේ තුළින් අබ්බා පියාණන් වහන්සේට ඔප්පු කරන්නෙමු.

එමෙන්ම මේ මාසය පුරාවටම හෙබ්‍රෙව් වරුන්ට ලියන ලද ලිපියේ සඳහන් පරිදි ජේසු ක්‍රිස්තුන් වහන්සේ මුළු මිනිස් සංහතියේ ගැළවීම සඳහා බලවත් හැඬීමෙන් ද, කඳුළු සැලීමෙන් ද කළ යාච්ඤාවට දායක වෙමින් ඔවුන් වහන්සේගේ ජීවිතාකල්පය අපගේ ආකල්පය කරගෙන දෙවියන් වහන්සේගේ ශුද්ධවූ කැමැත්ත අප තුළ, අප පවුල තුළ, අප සංඝය, මීසම, සමස්ත පුබුදු ජනතාව තුළ, ශුද්ධවූ සභාව තුළ සිදුවන්න කියා බලවත් හැඬීමේ හා කඳුළු සැලීමෙන් ද යාච්ඤා කන්නලව් කිරීමට තීරණය කරමු.

**"මන්ද අපට ඇත්තේ අපගේ දුබලකම් ගැන අනුකම්පාවක් නැති උත්තම පූජකයෙකු නොව, හැම අයුරින් ම අප වාගේ පරීක්ෂාවලට මුහුණ පෑ පාප රහිත උත්තම පූජකයෙකි. එබැවින් අපේ ඕනෑඑපාකම් වලදී අපේ සරණ සඳහා දයානුකම්පාව ලබන පිණිස බිය සැක නැතිව කරුණාවේ සිංහාසනය වෙත ළඟා වෙමු. "**

(හෙබ්‍රෙව් 4:15-16)

පළමු සතිය : දිව්‍යමය කියවීම - හෙබ්‍රෙව් 5:7-11

අයැදීමට විශේෂ යොමුව :

මෙම චතාරික සමය තුළ ජේසු ක්‍රිස්තුන් වහන්සේ මුළු මිනිස් සංහතියම ගැළවීම සඳහා යාච්ඤාවෙන් ද හැඬීමෙන් ද කඳුළු සැලීමෙන් ද අබ්බා පියාණන් වහන්සේ ඉදිරියේ පෙනී සිටියාක් මෙන් පුබුදු ජනතාව ඇතුළු සමස්ත කිතුනු ජනතාවම පශ්චත්තාපයෙන් සහ මනස්ථාපනයෙන් යුක්තව තම වැරදි මාර්ග හරිගස්සා ගැනීමට අවැසි ශුද්ධාත්මාලෝකය ලැබෙන පිණිස යාච්ඤා කරමු.
(විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :

* ස්වාමි තාත්තා, දිවැසි එකතුව, සහයක එකතුව ඇතුළු සමස්ත පුබුදු ජනතාව වෙනුවෙන්
* මේ කාලයේ අඛණ්ඩ යාච්ඤාවේ යෙදෙන සියළු දෙනා සහ අනගාරික දූත සේවාවේ නියැලී සිටින සියළු දෙනා වෙනුවෙන්.
* මාසයේ පළමු ඉරුදින පැවැත්වෙන සාංඝික පවුල් දිනය සහ වචනයේ සේවකයන් වෙනුවෙන්.
* ශ්‍රී ප්‍රශංසාරාමය, ධර්මාරාමය, රම්‍යාරාමය, මීගමු පුබුදු නිවස, ජාඇල ක්‍රිස්තු කේන්ද්‍රය ඇතුළු පුබුදු නිවෙස්වල සහ මධ්‍යස්ථානවල සේවය කරන සියළු දෙනා සහ ඒ ඒ ස්ථානවල කෙනෙ දූත කාර්යයන් වෙනුවෙන්.
* සුදතුම් ගමන ලියන ලේඛකයන්, බෙදා හරින්නන්, පුබුදු ව්‍යාප්ති සේවාව සහ පුබුදු මුද්‍රණාලය වෙනුවෙන්.

* ප්‍රශංසාරාමයේ පුබුදු කාර්යාලය, ආර්ථික සේවාව, ව්‍යාප්ති සේවාව, භෝජනාගාර සේවාව, ඇසිදිසිය, පුබුදු පුස්තකාලය, ආරාමයේ රියදුරන්, කම්කරුවන් සහ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ඉදිරියේ අඛණ්ඩව යැදුමෙන් පෙනී සිටින කුඩා කණ්ඩායම වෙනුවෙන්.
* වෙනත් අයැදීම්……

දෙවන සතිය : දිව්‍යමය කියවීම - 1පේදුරු 4:1-6

අයැදීමට විශේෂ යොමුව :

මෙම චතාරික සමය තුළ පශ්චත්තාපයෙන් සහ මනස්ථාපනයෙන් යුක්තව චතාරික කාලයට ඇතුළු නොවන, උනන්දුවක් නැති සියළුම කිතුනුවන් වෙනුවෙන් (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :
* ශුද්ධෝත්ම පියතුමා ඇතුළු රදගුරු පූජක පැවිදි සහ ධර්මදූත සේවාවේ නියැලෙන සියළු දෙනා වෙනුවෙන්.
* පවතින දේශපාලන වාතාවරණය තුළ ඔවුනොවුන් අතර තිබෙන මතබේදවලට අරගල කරනවාට වඩා රටේ සංවර්ධනය සහ සුභ සිද්ධිය සඳහා කටයුතු කිරීමට අවැසි ශුද්ධාත්ම ප්‍රඥාව රටේ නායකයන්ට ලැබෙන පිණිස.
* වෙනත් අයැදීම්….

තෙවන සතිය : දිව්‍යමය කියවීම - 1පේදුරු 4: 12-19

අයැදීමට විශේෂ යොමුව :

පිලිකා, වකුගඩු, හෘද්‍යාබාධ, අංශභාග ඇතුළු දීර්ග කාලීනව රෝගයන්ට ගොදුරු වී සිටින සියළු දෙනා සහ ඔවුන්ට ඇප උපස්ථාන කරන සියළු දෙනා වෙනුවෙන්. (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් ….

සතරවන සතිය : දිව්‍යමය කියවීම - හෙබ්‍රෙව් 4: 4-16

අයැදීමට විශේෂ යොමුව :

ඉදිරියේ එළැඹෙන ශුද්ධවූ සතිය තුළ සමස්ත කිතුනු ජනතාවට ගැඹුරු පශ්චත්තාපයකින් සහ මනස්ථාපනයෙන් යුක්තව අර්ථවත් පාස්කුවකට ඇතුළු වීමට අවැසි ශුද්ධාත්ම බලය ලැබෙන පිණිස. (විනාඩි 10ක් පමණ)

වෙනත් අයැදීම් :
* මාර්තු මස 28,29,30,31 දිනවල ප්‍රශංසාරාමයේ පැවැත්වෙන පාස්කු සම්මේලනයට සහභාගි වන ජනතාව සහ වචනයේ සේවකයන් වෙනුවෙන්.
* වෙනත් අයැදීම් ….

වෙනත් විශේෂ අයැදීම් සහ දැනුම් දීම් :

* මාසයේ සෑම සිකුරාදාවක්ම යාච්ඤාවේ සහ උපවාසයේ දිනයක් ලෙස ගත කරන්න.
* රෝගීව ඔත්පල තත්ත්වයෙන් සිටින සංගීතවේදී අයිවෝ ඩෙනිස් තාත්තා වෙනුවෙන්.
* චතාරික භාවනාවට සහ අඛණ්ඩ යාච්ඤාවට ඇතුළු වන්න.

- අයැදීමේ සහ මැදිහත් වීමේ සේවාව -

****************************